**විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය - 2013**

---

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ප්‍රංශ සංවර්ධන නියෝජිතායතනය (ප්‍රසනි) අතර 2005 ඔක්තෝබර් 05 දින එළඹි අංක 3000 01 එච් දරන ණය ගිවිසුමේ II වගන්තියේ 8 වැනි ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

විසල් ත්‍රිකුණාමලය ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ ( සංරචකය - "2" - ජල සම්පාදන හා පුනරුත්ථාපන) ව්‍යාපෘති ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය එවකට නාගරික සංවර්ධන හා ජල සම්පාදන අමාත්‍යාංශය වර්තමානයේ නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජා ජ ස ජ ම ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වන්නේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නගර සහ කඩවත් සතර, කින්නියා , කන්තලේ, තඹලගමුව , ඊච්චලම්පතායි සහ කුච්චවේලිහි කොටසක් යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල 330,000 ක් වන ජනතාවට ආරක්ෂිත පානීය ජලය සැපයීමයි. රු.මිලියන 1500.75 කට සමාන යූරෝ මිලියන 10.35 ක් හා රු.මිලියන 1,650 කට සමාන යූරෝ මිලියන 10 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මූල්‍යායනය කිරීමට පිළිවෙලින් ඒජන්සි ෆ්‍රැන්කයිස් ඩි - ඩිවලොප්මන්ට් ඔෆ් ෆ්‍රාන්ස් සහ රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් (ආර්පීඊ) එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය සිදුකරගෙන යාමේ අරමුණින් රු.මිලියන 1,003 ක් මූල්‍යායනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. කෙසේ වුවද පිරිවැය ඉහළයාම හේතුවෙන් රු.මිලියන 412.5 සමාන යූරෝ මිලියන 2.5 ක අතිරේක මූල්‍යායනයක් රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් විසින් ලබාදී තිබූ අතර, ඒ අනුව රිසර්ව් පේස් ඉමර්ජන්ට්ස් - ෆ්‍රෙන්ච් ප්‍රොටෝකෝල් යටතේ වෙන් කරන ලද මුළු මුදල රු.මිලියන 2,062.5 කට සමාන යූරෝ මිලියන 12.5 ක් දක්වා ගෙන එන ලදි. ව්‍යාපෘතියේ කටයුතු 2006 පෙබරවාරි මස ආරම්භ කරන ලද අතර 2010 නොවැම්බර් අවසානය වන විට නිම කිරීම සඳහා මුලිකව සැලසුම් කර තිබුණි. කෙසේ වුවද පසුව ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2015 පෙබරවාරි 02 දක්වා අවස්ථා 3 කදී දීර්ඝ කරන ලදි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කර සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

---

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති

කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන , ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීමට හැකිවන පරිදි පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, වියාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ නියම කරන ලද පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි ද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

3. **මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගතවන ගැලපීමවලින් ඇති වන බලපෑම් හැර, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම්, එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය, එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

4. **මූල්‍ය ප්‍රකාශන**

-----------------

4.1 **මූල්‍ය කාර්ය සාධනය**

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.614,900,136 ක් සහ ඉකුත් වර්ෂයේ වියදම රු.1,814,093,294 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.4,641,083,407 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| කෙරීගෙන යන වැඩ - ඒ එෆ් ඩී | 160,961,858 | 494,457,763 | 1,496,912,703 |

| | | | |
|---|---|---|---|
| කෙරීගෙන යන වැඩ - ආර් පී ඊ | 230,866,756 | 954,776,633 | 1,702,911,844 |
| කෙරීගෙන යන වැඩ - ශ්‍රී ලං ර | 199,736,270 | 362,411,925 | 1,395,230,000 |
| ස්ථාවර වත්කම් - පිරිවැයට | 23,335,252 | 2,446,973 | 46,028,860 |
| | ----------------- | ---------------- | ------------------ |
| එකතුව | 614,900,136 | 1,814,093,294 | 4,641,083,407 |
| | =========== | ========== | =========== |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූල්‍ය ප්‍රකාශන හා ලබා ගත හැකිවූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් හා 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | **යුරෝ** | **රු.** |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 27,256 | 4,582,456 |
| එකතු කළා :- ඌන පූරණයන් | 1,555,772 | 258,271,477 |
| විදේශ විනිමය වාසිය | - | 17,489,246 |
| | ---------- | -------------- |
| | 1,583,028 | 280,343,179 |
| **අඩු කලා - ආපසු ගැනීම්** | 1,053,465 | 184,782,354 |
| | ---------- | ------------- |
| **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **529,563** | **95,560,825** |

## 5. විගණන නිරීක්ෂණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජලය ඇතුල්වන තැන් දෙකකට හා ජලය පිරිසිදු කිරීමේ පිරියතයට විදුලිබලය සැපයීම වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ තබා ඇති ඇප තැන්පතු මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු තැන්පතු ලෙස දක්වනු වෙනුවට ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී ඒජන්සි ෆැන්කයිස් ඩි ඩිවලොප්මන්ට් විසින් කොන්ත්‍රාත්කරුවකුට ගෙවන ලද රු.මිලියන 5.2 කට සමාන යූරෝ 31,517 ක් වූ වැඩ පූර්ව අත්තිකාරම් 2012 හා 2013 වර්ෂවලදී සාවද්‍ය ලෙස දෙවරක් ගිණුම්ගත කර තිබුණි. එබැවින් වැඩපූර්ව අත්තිකාරම් ගිණුමේ දැක්වෙන ශේෂය හා 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඒ එෆ් ඩී ණය ගිණුම එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මෝටර් වාහන මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.මිලියන 1.6 ක එකතු කළ අගය මත බදු (වැට්) ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව කෙරීගෙන යන වැඩ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඈ) රු.95,560,825 කට සමාන යූරෝ 529,563 ක් වූ 2013 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන ශේෂය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.1,009,417 කට සමාන යූරෝ 26,801 ක් ලෙස සාවද්‍යව දක්වා තිබුණි.

(ඉ) කොන්ත්‍රාත්කරුවකුගෙන් ලැබුණු රු.මිලියන 2.5 කට සමාන යූරෝ 14,129 ක් වූ වට්ටම, ගෙවිය යුතු අසම්භාව්‍යයන් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**6.1 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

**--------------------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

(අ) 2014 පෙබරවාරි 28 දින හෝ ඊට පෙර විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 අගෝස්තු 20 දින දීය.

(ආ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන කාර්යයන් පිළිබඳ මූල්‍ය පාලනයන් තහවුරු කර ගැනීම සඳහා, මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන චක්‍රලේඛය අනුව, ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 38.2 ක් වූ දේපල, පිරියත හා උපකරණ වල භෞතික පැවැත්ම තහවුරු කර ගැනීමට හැකිවන පරිදි මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව භෞතිකව සමීක්ෂණය කර නොතිබුණි.

(ඈ) 2007 අංක 13 පනත හා 2009 අංක 18 පනතින් සංශෝධිත 2005 අංක 05 දරන මුදල් පනතේ 03 වගන්තියේ දක්වා ඇති පරිදි කොන්ත්‍රාත් ගෙවීම්වලින් ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බදු සියයට 1 ක් ව්‍යාපෘතිය විසින් අයකර ගෙන තිබුණි. 2013 දෙසැම්බර් 31 දිනට මුළු කොන්ත්‍රාත් ගෙවීම්වලින් අයකර දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්ට ප්‍රේෂණය කර නොතිබූ මුදල රු.මිලියන 24 ක් විය.

**5.3 මතභේදයට තුඩුදෙන කරුණු**

**------------------------------**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සාමාන්‍ය පරිපාලන කටයුතු සඳහා යොදාගෙන තිබුණද, පරිචයක් වශයෙන් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරිම ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලය විසින් සිදුකරන අතර සියයට 20 ක පොදුකාර්ය පිරිවැයක් ඒ සඳහා අයකරනු ලැබේ. එබැවින් සමාලෝචිත වර්ෂය තුළ මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු මුදල්වලින් රු.මිලියන 6.9 ක පොදුකාර්ය පිරිවැය ව්‍යාපෘතියෙන් අයකිරීමට හේතු විගණනයේදි සාධාරණීකරණය කළ නොහැක.

**6. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**------------------------------------**

**6.1 අරමුදල් උපයෝජනය**

**------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සැලසුම්කළ කාලපරිච්ඡේදය තුළදී වෙන්කරන ලද සම්පත් යොදාගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු වනු පිණිස, සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් වගකීම් සහිතව මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් තිබිය යුතු වුවද ව්‍යාපෘතිය විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) මූලායයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය හා 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| **ප්‍රභවයන්** | **මූලායයනය සඳහා එකඟවූ මුදල** | | **2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය** | **වර්ෂය තුළ උපයෝජනය කළ අරමුදල්** | **2013 දෙසැම්බර් 31 දක්වා උපයෝජනය කළ අරමුදල්** | |
|---|---|---|---|---|---|---|
| | **යුරෝ මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **යුරෝ මිලියන** | **රු.මිලියන** |
| ආසබැ | 10.35 | 1,500.75 | 245.00 | 190.45 | 10.23 | 1,642.25 |
| ආර්පීඊ | 12.50 | 2,062.50 | 258.00 | 214.53 | 10.25 | 1,669.36 |
| ශ්‍රීලංර | 6.78 | 1,003.00 | 300.00 | 273.99 | 8.59 | 1,388.78 |
| **එකතුව** | **29.63** | **4,566.25** | **803.00** | **678.97** | **29.07** | **4,700.39*** |

* උපචිත වියදම්, වැඩ පූර්ව අත්තිකාරම් සහ කාර්යාලීය කුලි මත අත්තිකාරම් ඇතුළත් නොකිරීම හේතුවෙන් ඉහත දැක්වෙන මුදල මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන මුදල සමඟ එකඟ නොවේ.

## 6.2 භෞතික කාර්ය සාධනය

වැඩ පිළිබඳ විෂය පථය වෙනස්කිරීම හා කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් දෙකක් පිළිවෙලින් සියයට 56 ක සියයට 40 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි.